08 වන පිටෙන්

විකල්ප (ඡායා) අගමැතිය.
ඒ වගේම පාර්ලිමේන්තුව තුළ (ඡායා) විකල්ප කැබිනට් ඇමති මණ්ඩලයක් (15 දෙනෙක්) ද විපක්ෂයෙන් පත් කළ පළාත් සභා විකල්ප (ඡායා) මහා ඇමති වරු නව දෙනෙක් ද (9) පළාත් සභා (ඡායා) විකල්ප නියෝජ්‍ය ඇමතිවරු ද පත් විය.

මා මේ සමඟ පාර්ලිමේනත්තු සභා පිහිටු වාගත යුතු ආදර්ශ සටහනක් ද අමුණා ඇත.

- පාර්ලිමේන්තු මහා මැතිවරණය වසර තුනකට වරක් පැවැත්වීම ඉතාමත් සුදුසුය. බලය ලබන පක්ෂයකට වසර තුනක කාලයක් රටට නිවැරදිව සේවය කිරීමට අවංකව පැහැදිලිව පුළුවන් වේ.

එසේ එම පක්ෂයක සිය කාර්ය හරි හැටි ඉටු නොකලේ නම් රටේ ජනතාවට ප්‍රජාතාන්ත්‍රික අයිතිය මත රජය වෙනස් කර වඩා රටෙ පැවැත්මට සියලුම දෙයින් නිවැරදි ප්‍රතිපත්ති ඇති පක්ෂයකට ජනවරම ලබාදිමට ඉතාමත් වැදගත් බව මා විශ්වාස කරමි.

(පළමුව රටේ වයස අවුරුදු 18 ඉහල සෑම පුරවැසියෙක්ම අනිවාර්යෙන්ම ඡන්දය ප්‍රකාශ කිරීමේ නීතියක් පැනවිම සුදුසුය.)

සැම පාර්ලිමේන්තු මන්ත්‍රි වරයෙක්ම උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති මැතිවරණයට පෙර සිය වත්කම් මහජන ප්‍රසිද්ධියට පත් කර ඡන්දයට ඉදිරිපත් කිරීමට සියලුම පක්ෂවල වගකීම් වේ. එසේම ඉතා ප්‍රබල නීතියක් ලෙස මැතිවරණ දෙපාර්තමේන්තුව ක්‍රියා කල යුතුය.

සෑම මන්ත්‍රිධුරයක්ම ආසන මට්ටමින් වැඩි ඡන්දයෙන් ජයගත් ඒ ඒ පක්ෂවල අපේක්ෂකයා පාර්ලිමේන්තුවට තේරි පත්වේ. ඒ අනුව වැඩි ආසන ගණනාවක් දිනු පක්ෂය එහි නායකයා සහ අගමැති ලෙසත් ඔහු විසින් නම් කරන විශේෂයෙන්ම ඒ ඒ කැබිනට් ඇමති තනතුරු සඳහා අවශ්‍ය උගත්කම් ඇති අය පත් කරනු ලැබේ.

පාර්ලිමේන්තු මහා මැතිවරණය සඳහා ආසන මට්ටමින් තරඟ වදින උදාහරණයක් විදියට බස්නාහිර පළාතට අතුලත් පාර්ලිමේන්තු මහා මැතිවරය සඳහා ආසන මට්ටමින් තරඟ වදින උදාහරණයක් විදියට බස්නාහිර පළාතට ඇතුළත් පාර්ලිමේන්තු ආසන සංඛ්‍යාවෙන් වැඩි ආසන ගණනක් දිනාගන්න පක්ෂයට පක්ෂ නායකයා ඇතුළු පක්ෂ කෘත්‍ය අධිකාරි මණ්ඩලය විසින් තෝරා පත් කරගන්න මන්ත්‍රි වරයා බස්නාහිර පළාතට මහා ඇමති ලෙස පත්වේ.

තවදුරටත් පැහැදිලි කලහොත් පාර්ලිමේන්තු මැද කොළඹ ආසනයේ පක්ෂයේ අපේක්ෂකයා මහා ඇමති ලෙස දිවුරුම් දුන් පසු ඔහු හෝ ඇය හැඳිවෙන්නේ මේ ආකාරයටය මැද කොළඹ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ බස්නාහිර පළාතේ මහා ඇමති ලෙසය.

මේ ආකාරයට සෑම පලාත් සභා මහා ඇමතිවරු 9 දෙනා ඉහත සඳහන් ආකාරයට තේරි පත්කරගන්නා අතර එම මහා ඇමතිවරු ඒ ඒ පළාත් සභාවට ඔහුන්ගේ යටතේ නියෝජ්‍ය ඇමති වරු තිදෙනෙක් ඉතාම උගත් කාර්යය පිළිබඳ මහා දැනුමක් ඇති ඒ වගේ ම අමාත්‍යාංශය ඒ ඒ පළාතේ අවශ්‍යතාවයට අනුව පිහිටුවා (උදහරණයක් විදියට දකුණු පළාත ධීවර කටයුතු සඳහා නියෝජ්‍ය ඇමතිවරයෙක් පත්කිරීම.)

මෙම නියෝජ්‍ය ඇමතිවරු මහ ඇමති තේරි පත් වූ පක්ෂයේ ආසන ජයලද මන්ත්‍රි වරුන්ය. ඔහු හේ ඇය හැඳින්වෙන්නේ මේ ආකාරයටය ගාල්ල පාර්ලිමේන්තු මන්ත්‍රී සහ දකුණු පළාතේ ධීවර කටයුතු සඳහා නියෝජ්‍ය ඇමතිවරයා ලෙසය.

මෙම නියෝජ්‍ය ඇමතිවරු තිදෙනා එම පළාත් සභාවේ මහා ඇමැති යටතේ එක ගොඩනැගිල්ලක අමාත්‍යාංශ කාර්යාල තුනක සේවයේ යෙදිය යුතුය.

සෑම පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙක්ම අගමැති, ඇමැතිවරු ඇතුළුව තම ආසන වල රජයෙන් නඩත්තු වෙන කාර්යාලයක් පිහිටුවා පාර්ලිමේන්තු සැසි වාරයන්ට සහභාගී නොවන අවස්ථාවල තම ආසනයේ සිට තම ආසනයේ ජනතාව වෙනුවෙන් සේවයේ යෙදිය යුතුය. මෙම කාර්යාලය තම නිවසේ පවත්වාගෙන යෑම සම්පූර්ණයෙන්ම තහනම් වන අතර එක් මන්ත්‍රී වරයෙකුට 4 දෙනෙකු ගෙන් යුත් ඔහුගේ පක්ෂයන් පත් කල එක් සහ රජයේ සිවිල් සේවයේ නිළධාරීන් තිදෙනෙක් ඇතුලත් වන අතර පවුලේ කිසිම කෙනෙකුට කිසිම තනතුරක් මොනම අවස්ථාවක් දැරිය නොහැක.

නමුත්, මෙහි දී පියා සහ පුතා / දුව / බිරිඳ /අම්මා / සහෝදර සහෝදරියන් එකට මන්ත්‍රීධුර දැරීම කිසිම බාධාවක් නැත. මන්ත්‍රිධුර සඳහා ඒ ඒ පක්ෂ සාමාජිකත්වයෙන් අනුමැතිය ලබා ආසනයට තරග වැද ජනතාව විසින් ඔහුන්ගේ කැමැත්තෙන් තෝරා පත් කරන බැවිනි.

අධිකරණයෙන් පටන් ගෙන පොලිසිය අල්ලස් කොමිසම මාධ්‍ය සහ දැනට වර්තමානයේ රජයේ අත් කොලුවී ඇති ජනතා සේවයට කැපවූ අමාත්‍යාංශ හෝ ආයතන සම්පූර්ණයෙන්ම දේශපාලනියකරනයෙන් වහා ඉවත් කර ස්වාධීන ලෙස කටයුතු කිරීමට සලස්විය යුතුය.

ශ්‍රී ලංකා පොලිසිය මුළු රටටම බලපවත්වන පරිදි පොලිස්පති වරයා යටතේ ක්‍රියාත්මක වෙන අතර සම්පූර්ණයෙන්ම ස්වාධීන ආරක්ෂක අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවක් වන අතර පොලිස්පතිවරයා පත්වන්නේ කිසිම දේශ පාලන පත්වීමකින් නොවන තනතුරට ඇති සුදුසුකම් අනුවය. පොලිස්පති වරයා විසින් තනතුරට ඇති සුදුසුකම් අනුව සෑම පළාත් සභාවකටම ඒ ඒ පළාතට අනුකූලව පොලිස් කොමසාරිස් වරයෙක් පත් කර ඔහු හෝ ඇය යටතේ පොලිස් ස්ථාන පාලනය කළ යුතුය. අගමැති, ඇමැති වරු සහ මන්ත්‍රිවරු කිසිම ආකාරයකින් පොලිසියේ රාජකාරියට අත ගැසීම ඔහු හෝ ඇය ක්ෂණිකව මන්ත්‍රීධුර අහෝසි වන සහ දරුණු දඩුවම් ලබව වරදකි. මෙම නීතිය පොලීසිය, හමුදාව, රජයේ සියළුම ආයතන වලට අනිසි ලෙස බලපෑම් කරන ඕනෑම නිලධාරියෙකුට සහ අගමැති, ඇමැති වරු සහ මන්ත්‍රිවරු මෙලෙස දඩුවම් ලබන වරදක් සේ නිතිගත කර සෑම ක්‍රියා පටිපාටියක්ම විනිවිදව තිබීම රට ඉහලට ගැනීමට එකම ක්‍රමය වේ.

රට තුල ඉතාමත් පැහැදිලි නිදහස් මාධ්‍ය ක්‍රමයක් පැවැත්විය යුතු අතර "චන්දිබට්ට මාධ්‍ය කලාව" සම්පූර්ණයෙන්ම දරුණු දඬුවම් ලබන වරදක් ලෙස නීති ගත කල යුතුය. (1970 77 සිරිමාවෝ බණ්ඩාරනායක සමඟි පෙරමුණ ලේක්හවුස් රජයට පවරාගෙන චිද කරපු විනාශය සදතණික සාපයක් වී ඇත.) මාධ්‍ය කාර්යය භාර්යය වියයුත්තේ රටේ ජනතාවට සත්‍ය පෙන්වීම සහ ජනතාව වෙනුවෙන් අවදියෙන් සිට හොඳ නරක පෙන්වා ජනතාවට ඉහලම සේවයක් කිරීමය.

තිස් වසරක් පුරා අප රටේ වරින් වර බලලෝභී දූෂිත දේශපාලකයෝ ජාතිවාදය, මුල් කරගෙන පැවැත්වූ අතිමහත් කෲර යුද්ධයේදී සැබෑ රණ විරුවන් මියගිය සහ අත්පා දැය වෙනුවෙන් කැපකළ, අද යුදහමුද සේවාවලින් විශ්‍රාම ලබා හෝ ඉවත් වූ යුද්ධය වෙනුවෙන් කැප වූ සෑම සෙබළෙක්ම රජය දෙඇස් මෙන් සලකා ඉතා ගෞරවපූර්වකව ආර්ථික සහ අනිකුත් සියළු පහසුකම් ලබාදෙන අතරම සෑම පළාත් සභා 9 තුල ගුවන්, නාවුක, යුද හමුද කඳවුරු ඒ ඒ පළාත් දේශ පිහිටීම් අනුව පවත්වාගෙන යෑම රජය අනිවාර්යෙන්ම කලයුතු දෙයකි.
1970 සිරිමවෝ බණ්ඩාරනායක සමඟි පෙරමුණ ඇරැඹූ මන්ත්‍රි / ලියුම් වලට රැකියාදීම සහ පක්ෂයේ සහ තම හිතවතුනට රැකියා තනතුරු ලබාදීම වැනි දේ දේශ ද්‍රෝහි ක්‍රියා ලෙස සලකා නව පාලන ක්‍රමය තුල රැකියා සහ කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ පුද්ගලික ආයතනයද සහභාගීත්වයෙන් රටේ සෑම කෙනෙතුටම ඒ ඒ සුදුසුකම් අනුව රැකියා සපයා දීමට බලය ලබන රජයේ යුතුකමක් වන අතර මොනම හේතුවකටවත් ආගම්, ජාති සහ ලිංග බේදය මුල් කරගෙන රටේ පුරවැසියාගේ අයිතිවාසිකම් බරපතල වරදක් ලෙස නීති ගත කල යුතු අතර මෙය සෑම කාර්යක් සඳහාම බලපානු ලැබේ. එමෙන්ම ස්වාධීන මාධ්‍ය අවධියෙන් සිට වැරදි කරුවන් පෙන්වා දීම ඉතාම වැදගත් වේ.

මේ ලෝකයේ ශ්‍රී ලාංකික ජනයා තරම් කාරුණික මහත්මා ගුණදම් වලින් සපිරුණු ජාතියක් වෙන කිසිම රටක නැත. නමුත් කරුණාව මනුෂකම් වලින් ඈත්වී මිනි මරණ දේශයක් ගැහුනුන් කුඩා ළමයින් දූෂණය කරන සුරාව අබ්බවා මත් කුඩු, මුදල් බලය තුල ඕනෑම සාපරාධි ක්‍රියාවක යෙදෙන ගඳ ගසන නීතියක් ඇති රටක් බවට එනම් මා මුලින් සඳහන් කල සාගරයක් මැද අමන රටක් කලේ මේ දූෂිත දේශපාලුවන්ය.

දේශපාලනය යන වචනයේ තේරුමක් නොදත් මේ අමනුෂ්‍යයින් මුදල්, බලය උප යෝගී කරගෙන ජනතා ප්‍රසාදය කොල්ලකා බලයට පත්වන්නේ රටට ජාතියට සේවයක් කිරීමට නොවේ. මිටි ගණන් මුදල් උපයන්නටය. නමුත් මියගිය දිනක එක සතයක්වත් තම මිනිපෙට්ටියට දමාගෙන යානොහැකි එමෙන්ම තම දූ පුතුන් දරුවන්, නෑදැයින් පරම්පරා ගණනාවක් ශාප ලබන ක්‍රියාදමයක් තුල අවාසනාවට රටත්, ජනතාවත් නොනවත්වා ගෙවනා විදවන දුර්බික්ෂ විපාකය අවසන් කලයුතු කාලය පැමිණ ඇත.

වාසියට, බලයට ආත්මාර්කාමීත්වය පසෙකට ලා "අද මගේ දවස හෙට මගේ රටේ සුබසිද්ධිය සඳහා " යන සුබවාදි එක්ව රට ගොඩනගන්න කාලය පැමිණ ඇත.

33 වන පිටට




